# පෙරවදන

මහාචාර්ය යටදොළවත්තේ ධම්මවිසුද්ධි ස්වාමීන්වහන්සේ විසින් සම්පාදිත මෙම ශාස්ත්‍රීය නිබන්ධයේ මූලික අරමුණ පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් ඇසුරින් මධ්‍යකාලීන ලාංකික භික්ෂු සමාජය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමයි. කතිකාවත යන්නෙහි අර්ථපරීක්ෂණයකින් හා කතිකාවත් නමින් හැඳින්වෙන ලේඛන පිළිබඳ ඓතිහාසික සමාලෝචනයකින් ඇරඹෙන මේ අධ්‍යයනය පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්වල ආර්ථික හා දේශපාලන පසුබිම, මහාපැරකුම්බා රජතුමාගේ ශාසනික සමගිය, භික්ෂු අධ්‍යාපනය හා ආධ්‍යාත්මික ජීවිතය, ආරාම පාලනය හා සංවිධානය, තත්කාලීන සංඝ සමාජය තුළ පැවති තනතුරු නාම හා උපාධි සම්මුති, භික්ෂූන්ගේ ප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති යන ශීර්ෂ ඔස්සේ සවිස්තරව ඉදිරිපත් කොට ඇත. කතිකාවත්වලින් අනාවරණය කර ගත හැකි තොරතුරු ගෙනහැර දැක්වීමේදී මධ්‍යකාලීන ශාසන ඉතිහාසයට අදාළ වෙනත් ඓතිහාසික මූලාශ්‍රයයන් තුළ විසිර පවත්නා තොරතුරු ද මෙහිලා සැලකිල්ලට ගෙන ඇත. මෙහි එන උපග්‍රන්ථයෙහි පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් දෙකේ නව සංස්කරණයක් හා මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කර ගනු ලැබූ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් ඇතුළු ග්‍රන්ථ නාමාවලියක් ද ඇතුළත් කර තිබීම මේ විෂය පිළිබඳව තවදුරටත් පර්යේෂණයෙහි යෙදීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි ප්‍රදානය සඳහා පිළිගනු ලැබූ මෙම ග්‍රන්ථය සම්පාදනය කරන ලද්දේ මීට අවුරුදු තිහකට පමණ පෙරය. එහෙත් මෙම විෂයට අදාළව ඊට පසුව පළ වූ ශාස්ත්‍රීය ලිපිලේඛන සියල්ලම පාහේ සැලකිල්ලට ගෙන මෙම කෘතිය යථායෝග්‍ය ලෙස සංශෝධනය කොට ඇති බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. විධිමත් පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකි මෙම ග්‍රන්ථය බෞද්ධ ඉතිහාස අධ්‍යයනය සඳහා වූ විශිෂ්ට ශාස්ත්‍රීය ප්‍රදානයක් වශයෙන් පමණක් නොව, ශාස්ත්‍රීය නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳව ආදර්ශයක් ලබා දෙන ග්‍රන්ථයක් වශයෙන් ද අගය කළ හැකිය.

මහාචාර්ය වයි. කරුණාදාස
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය

1998 ජූලි 27 දින